(c) www.sinhalalyrics.com

හෙවනැලිද ඉකිබිඳි ගණ අඳුරේ
ගහකොළද පණ අදී බිම වැතිරී
අභය ඉල්ලා යදින්නී ඈ ආලයේ නාමේන්

ගිරි හිසින් උදාවූ මධු සඳ බැස යයි
වන හිසින් නැගී ආ පිළිරැව් වියැකෙයි
මුනින්තලාවේ සුදවල යහනත
තැවෙන්නී ඈ ආලයේ නාමෙන්

කුළුඳුලේ පිපී ආ මධු මල මැලවෙයි
දොල දිගේ ගලා ආ දියවැල බොරවෙයි
පිදූ පාපයෙන් හද සැළමුනු පෙම
තැවෙන්නී ඈ ආලයේ නාමෙන්

පද රචනය - සුනිල් ආරියරත්න
සංගීතය - ස්ටැන්ලි පීරිස්